# ජාතික ස්වරූපයේ රූපවාහිනියක සංකල්පීය සහ ප්‍රතිපත්තිමය ශක්‍යතාව පිළිබඳ දාර්ශනික පර්යාලෝක

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ටියුඩර් වීරසිංහ

අද්‍යතන ජාතික සන්දර්භය තුළ රූපවාහිනිය පිළිබඳව කතා කිරීමේදී එය එක් අතකින් විනාශකාරී, නිෂේධනාත්මක උපකරණයක් ලෙසද අනෙක් අතින් එය නිර්මාණාත්මක, ධනාත්මක, උපකරණයක් ලෙස විමසා බැලිය හැකි බව දශක දහයකට ආසන්න ලෝක රූපවාහිනියේ පැවැත්මේ ඉතිහාසය සාක්ෂි දරන්නේය.

අප ජීවත් වන සමාජය මූලික වශයෙන් ප්‍රධාන පැතිකඩ තුනකට බෙදා දැක්විය හැකිය. ඉන් එක් පැතිකඩක් වන්නේ පුද්ගලයාගේ සහ සමාජයේ ජීව පැවැත්ම සහතික කරන්නා වූ ද්‍රව්‍යමය පරිභෝජන වටිනාකම් සම්පාදනය කිරීමේ පැතිකඩ වන ආර්ථිකයයි. දෙවන පැතිකඩ වන්නේ බල, පාලනමය සහ ප්‍රජාමූලවාදී සම්බන්ධතා ඒකීය සමස්තයක් ලෙස පාලනය කරන දේශපාලන ක්‍රියාවලිය සංයුක්ත කරන්නා වූ රාජ්‍ය පැතිකඩ වන අතර, තුන්වන පැතිකඩ වන්නේ සමාජයෙහි ජීවත් වන විවිධ පුද්ගලයන්ගේ, කණ්ඩායම්වල විවිධාකාර වූ අදහස්, මත, සංවේදනා ආදී සමාජයේ මානසිකත්ව පැතිකඩ ඒකීය සමස්තයක් ලෙස ඒකාබද්ධ කරන්නා වූ දෘෂ්ටිවාදී පැතිකඩයි. වර්තමානයේදී සමාජයෙහි මෙම ත්‍රිත්ව පැතිකඩ ඒකීය සමස්තයක් ලෙස



ක්‍රියාත්මක වන බව පෙනේ. අද එය ඉතා ප්‍රබල මට්ටමකට වර්ධනය වී තිබේ.

සමාජයෙහි මානසිකත්ව පැතිකඩේ සංවිධානාත්මක සහ මෙහෙයුම් කාරක ස්වරූපය ලෙස දෘෂ්ටිවාදය ක්‍රියාත්මක වන අතර, ඊට අද්‍යතන සමාජයෙහි සුවිශේෂ අවධානයක් සහ ස්ථානයක් හිමි වන්නේය. එය අනෙක් ද්වි පැතිකඩ පවත්වාගෙන යෑම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසියක් බවට පත්වී තිබේ. සමකාලීන සමාජයෙහි මෙම අත්‍යවශ්‍ය දෘෂ්ටිවාදී, මානසිකත්ව, ආධ්‍යාත්මික තත්ත්වය අඛණ්ඩව සහ ස්ථාවරව පවත්වාගෙන යෑම සඳහා ප්‍රබල යාන්ත්‍රණයක් අවශ්‍ය අතර, වර්තමානයේදී එම කාර්යභාරය ඉටුකරනු ලබන්නේ සංහතික මාධ්‍ය මගින් වන අතර එහි ප්‍රබලතම උපකරණය ලෙස ක්‍රියා කරන්නේ රූපවාහිනියය බව අවධාරණය කළ යුතුය. එම නිසා සමාජයෙහි මානසිකත්ව, දෘෂ්ටිවාදී පැතිකඩ තුළ ක්‍රියාත්මක වන සමකාලීන රූපවාහිනිය සුවිශේෂීය ප්‍රපංචයකි. අද්‍යතන රූපවාහිනිය සමාජයෙහි ජීවත් වන දසලක්ෂ සංඛ්‍යාත මිනිසුන්ගේ, ජනතාවගේ සහ සංහතිකයින්ගේ සිතුවිලි, අදහස්, මත, ආකල්ප, සංවේද්‍යතා, සංවේදන, බුද්ධිමය මට්ටම්, චර්යා විශ්වාස සමාජ සහ රාජ්‍ය පාලන සංකල්ප හා ප්‍රතිපත්ති පමණක් නොව ආර්ථිකයේ ආකෘති, ප්‍රවණතා හැඩගැස්වීම කෙරෙහි බලපාන අන්තර් පැතිකඩමය මෙවලමක් බවට පත්වී ඇත. තවදුරටත් රූපවාහිනිය ඒ ඒ මානව සමාජ වලට වාර්ගික, ජාතික, සංස්කෘතික අනන්‍යතා සහ ඊට ආවේණික ගුණ වර්ධනය කිරීමේ, ප්‍රවර්ධනය කිරීමේ, ව්‍යාප්ත කිරීමේ, තහවුරු කිරීමේ සහ ඒවා අදාළ ස්වභාවික සහ සමාජ පරිගත තුළ පරාවර්තනය කිරීමේ නිරූපණය කිරීමේ, ඉදිරිපත් කිරීමේ මාධ්‍යයක් නොවන්නේය. මෙහි අර්ථය වන්නේ තවදුරටත් රූපවාහිනිය ඒ ඒ ජාතික සමාජවල මානසිකත්ව පැතිකඩේ විශේෂතාවලට අනුරූපව හෝ අනුකූලව සකස් නොවන අතර, රූපවාහිනියට අනුකූලව සහ අනුරූපව ඒ ඒ වාර්ගික සහ ජාතික සමාජවල මානසිකත්ව සහ දෘෂ්ටිවාදී පැතිකඩ හැඩගැසෙන්නේය යන්නය. මීළඟට වැදගත් වන්නේ සමාජ

පරිණාමයත් සමග එහි මානසිකත්ව පැතිකඩේ පරිණාමයේ ප්‍රධාන අවධි දෙකක් හඳුනාගත හැකිය. ඉන් පළමුවැන්න වන්නේ මානාසිකත්ව පැතිකඩය ඒ හෝ මේ ආකාරයට මිනිසුන්ගේ සංහතිකයින්ගේ ස්වාභාවික, ප්‍රකෘතික, මානසික ව්‍යුහයේ ගුණ සැලකිල්ලට ගනිමින් ඊට අනුවර්තනය වීමයි. දෙවන අවධියේදී මානසිකත්ව පැතිකඩ නිෂ්පාදනය කිරීමේ, සංරක්ෂණය කිරීමේ, බහුලීකරණය කිරීමේ මාධ්‍යයන් සොයා ගැනීම හා ඒවායේ දූවැන්ත පරිමාණ වර්ධනයත්, මිනිසුන්ගේ, සංහතිකයින්ගේ මානසිකත්වයට බලපෑම් කිරීමේ මාධ්‍යයන්ගේ දියුණුවීමත් නිසා මිනිසුන්ගේ, සංහතිකයින්ගේ මානසිකත්වයට පෙර වූ සම්බන්ධතාව එහි ප්‍රතිවිරුද්ධ දිසාවට වෙනස් විය (වීරසිංහ, 2007). මානව වර්ගයාගේ සමාජ පරිණාමීය ක්‍රියාවලිය තුළ මානව සමාජයෙහි මේ සිදු වූ විපරිවර්තනය පෘථිවිය පුරා ව්‍යාප්තව ජීවත් වන විවිධ මට්ටමේ සහ විවිධ වර්ගයේ ජනවාර්ගික, ජාතික පද්ධති සිය දහස් ගණනක් සිය පැවැත්ම පිළිබඳ මාරාන්තික තර්ජනයකට මුහුණ පාන්නේය (Clarke, Knake, 2010). මේ තත්ත්වය තුළ තවදුරටත් ඒ ඒ ජනවර්ග සහ ජාතීන්ට ආවේණික වූ, උරුම වූ, සංස්කෘතික, ආධ්‍යාත්මික, බුද්ධිමය ගුණයන් සහ විශේෂතා සංරක්ෂණය කරගැනීමේ, පවත්වාගෙන යෑමේ, වැඩිහිටි පරම්පරාවෙන් බාල පරපුරට සම්ප්‍රේෂණය කිරීමේ යන්ත්‍රණයක් වශයෙන් රූපවාහිනිය තවදුරටත් යොදාගත නොහැකිය.

මීට බලපෑ එක් ප්‍රබල ඓතිහාසික හේතුවක් වූයේ නූතන අවධියේ අවසානයේ දී බිහි වූ රූපවාහිනිය ඉතා වේගයෙන් ජාතික සන්දර්භයෙන් ඉවත්ව ගෝලීය සහ පාරජාතික අවධියකට ප්‍රවිෂ්ට වීමයි. රූපවාහිනියේ ස්වභාවය වඩාත්ම සමීප වන්නේ නූතනත්වයට වඩා පශ්චාත් නූතනත්වයට බව සඳහන් කළ යුතුය. මේ නිසා තාර්කිකව කල්පනා කරන විට නූතනත්වයේ අවසානයේ දී පහළ වී ඉතා වේගයෙන් පශ්චාත්නූතනවාදී ගතිලක්ෂණ ප්‍රකට කරමින් අද්‍යතනයේ දී පශ්චාත් නූතනත්වයේ ප්‍රබල කාරකයෙකු ලෙස ක්‍රියා කරන රූපවාහිනිය නූතනත්වයේ



ප්‍රශ්න විසඳීම සඳහා නූතනවාදී උපකරණයක් ලෙස යොදා ගන්නේ කෙසේද යන්න ප්‍රබල අභියෝගයකි. ඊට අමතරව සංහතික මාධ්‍ය ඇතුළු රූපවාහිනිය තවදුරටත් මිනිසුන්ගේ මානසිකත්ව පැතිකඩ පරාවර්තනය කරන සාම්ප්‍රදායිකවාදී හෝ නූතනවාදී උපකරණයකට වඩා මානසිකත්ව පැතිකඩ මගින් නිපදවන විඥාපනික නිෂ්පාදනවලට සරිලන පරිදි මිනිසුන්ගේ, සංහතිකයින්ගේ මානසිකත්වය, විඥානය වෙනස් වන්නට පටන් ගත්තේය. දූන් මානසිකත්ව පැතිකඩේ නිෂ්පාදිත (සංකල්පිය භාණ්ඩ) තවදුරටත් මිනිසුන්ගේ මානසිකත්ව පැතිකඩේ නියමයන්ට අනුකූල නොවූ, ආර්ථික සහ රාජ්‍ය පැතිකඩවල නියමයන්ට අනුකූලව නිෂ්පාදනය ආරම්භ විය. මෙය ඇත්ත වශයෙන්ම මානව වර්ගයාගේ මානසිකත්ව පැතිකඩේ නව යුගයක ආරම්භය පමණක් යැයි ප්‍රකාශ කිරීම ප්‍රමාණවත් නොවන අතර, සත්‍ය වශයෙන්ම එය මානව සංහතියේ මානසිකත්ව සංස්කෘතියේ නව යුගයකි(වීරසිංහ, 2016).

වර්තමානයේ මානව වර්ගයාගේ මානසිකත්ව ක්ෂේත්‍රයෙහි උද්ගතව ඇති අප ඉගෙන ගෙන හැර දක්වන ලද තත්ත්වය තුළ සමාජ සංවර්ධනය, සමාජ පාලනය සහ සමාජ ස්ථාවරතාව පවත්වාගෙන යෑමේ සාම්ප්‍රදායික, සම්භාව්‍ය හෝ නූතනවාදී විධික්‍රම, ක්‍රමවේද සහ මාදිල උන් මූලමය වශයෙන් විපරිවර්තනයකට ලක් වී ඇති බව අවධාරණය කළ යුතුය. නිදර්ශනයක් ලෙස පෙරදී බලය සහ පාලනය දරන ලද්දේ සම්පත් හිමිකර ගෙන සිටි පිරිස් වන අතර අද්‍යතන තත්ත්වය තුළ බලය සහ පාලනය හිමකර ගෙන සිටින්නේ තොරතුරු, විඥාපන මූලාශ්‍ර සහ තාක්ෂණය හිමි පිරිස් විසිනි (Toffler, 1980). මහජනතාවගේ මානසිකත්ව පැතිකඩට බලපෑම සඳහා අදාළ ගයුගය මගින් උත්පාදිත මාධ්‍යයන් භාවිත කළ යුතුය. ඒ අතර සමකාලීන සමාජය තුළ මූලික වන්නේ රූපවාහිනිය බව අපගේ අදහසයි. වර්තමාන සමාජය තුළ එක මොහොතකින් දශලක්ෂ සංඛ්‍යාත මිනිසුන්, සංහතිකයින් ආකර්ෂණය කරගැනීම සඳහාත් ඒක දිසානතියක රඳවා තබාගැනීම සඳහාත් රූපවාහිනිය තරම්

ප්‍රබල මාධ්‍යයක් නොමැත. එසේම අවධාරණය කළ යුත්තේ රූපවාහිනිය නිර්මාණය කිරීමේ සහ ජීවිතයේ මාධ්‍යයක් පමණක් නොව, එය විනාශ කිරීමේ සහ මරණයේ ද උපකරණයක් බවය. රූපවාහිනී දර්ශනවාදය පදනම් වන්නේ බිම් මට්ටමේ පොදු ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ නිදහසේ අදහස මතය.

රූපවාහිනීවේදය හෙවත් රූපවාහිනිය පිළිබඳ සමකාලීන විද්‍යාව රූපවාහිනියේ පෞරාණික ආකෘතික සහ පුරාණෝක්තියේදී ව්‍යුහයන් මගින් නිර්මිත කරන්නා වූ තිරය කෙරෙහි ආභාසි සම්බන්ධතා පිළිබඳ දැනුමට පමණක් සීමා නොවිය යුතු අතර, රූපවාහිනිය පිළිබඳ දර්ශනවාදයක් ගොඩනැගිය යුතුය. ජාතික ස්වරූපයේ රූපවාහිනියක සංකල්පීය සහ ප්‍රතිපත්තිමය ශක්‍යතාව එවැනි දාර්ශනික පර්යාවලෝකී සන්දර්භයක් තුළ පසක් කරගත යුතුය. රූපවාහිනිය සිය සම්භවයේ සිට පරිණාමය වී එය සමකාලීන වර්ධනයේ මට්ටමේ දී එහි සංකීර්ණත්වය අවබෝධ කර ගැනීම සඳහා රූපවාහිනී දර්ශනවාදයක අවශ්‍යතාව මතු වී ඇති බව පෙනේ. රූපවාහිනියේ වර්ධනයේ තර්කනය එහි සංකල්පයේ න්‍යායික-ක්‍රමවේදී පදනම නිර්මාණය කිරීමේ අවශ්‍යතාව මතු කළේය. ඒ අනුව මෙය සමස්තයක් ලෙස ගෙන සමකාලීන ගෝලීය සන්දර්භය තුළ ජාතික ස්වරූපයේ රූපවාහිනියක සංකල්පීය සහ ප්‍රතිපත්තිමය ශක්‍යතාව පිළිබඳ දාර්ශනික පර්යාලෝක වර්ධනය කිරීම කාලීන මෙන්ම ජාතික අවශ්‍යතාවක් බව අපි දකිමු.

ශ්‍රී ලාංකේය රූපවාහිනියට දශක හතරකට ආසන්න ඉතිහාසයක් ඇති අතර, එම ඓතිහාසික කාල පරිච්ඡේදය තුළ ශ්‍රී ලාංකේය රූපවාහිනියේ තාක්ෂණික, ව්‍යාපාරික, කර්මාන්තමය ආදී අංශ ඔස්සේ යම් යම් වර්ධනයන් මෙන්ම එය සමාජයෙහි සංස්කෘතික, සදාචාරාත්මක, දේශපාලන සහ ආකල්පමය පැතිකඩ කෙරෙහි වූ බලපෑම පිළිබඳවද යම් යම් මට්ටමින් අධ්‍යයනයන් කොතෙකුත් සිදුව තිබුණත් ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීම, නිර්මාණය කිරීම කෙරෙහි රූපවාහිනියේ



භූමිකාව කුමක්ද? එසේම එම ශ්‍රී ලාංකේය ජාතිය ගොඩනැගීමේ උපකරණය වන රූපවාහානියේ ජාතික ස්වරූපය, ආකෘතිය කෙසේ විය යුතුද? ජාතික රූපවාහිනිය කේන්ද්‍රීය සංරචකය වන එහි ජාතික දෘශ්‍ය රූපයේ ස්වරූපය කෙසේ සකස්විය යුතුද? ජාතික රූපවාහිනියේ න්‍යායික-සංකල්පීය පදනම මෙන්ම එහි දර්ශනය කෙසේ විය යුතුද? යන ප්‍රශ්නවලට තවමත් නිශ්චිත පිළිතුරු නොමැත. එම ප්‍රශ්නවලට උත්තර නොමැතිව ජාතික ස්වරූපයේ රූපවාහිනියක සංකල්පීය සහ ප්‍රතිපත්තිමය රාමුව පිළිබඳ දාර්ශනික පර්යාලෝකයක් අනුව කටයුතු කළ හැකි නොවේ.

විශේෂයෙන් රූපවාහිනියේ දෘශ්‍ය රූපයේ ඓතිහාසික පරිණාමය සහ වර්ධනය පිළිබඳව තවම කිසිම අධ්‍යයනයක් අප රටෙහි සිදුව නොමැත. මේ පිළිබඳව මූලික වශයෙන් සංස්කෘතිකවේදීන්ගේ සංස්කෘතික මානව විද්‍යාඥයින්ගේ, සමාජ විද්‍යාඥයින්ගේ, දෘශ්‍ය සමාජ විද්‍යාඥයන්ගේ, සන්නිවේදනවේදීන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ අවධානය යොමුවිය යුතුය. පසුගිය දශක හතරකට ආසන්න ශ්‍රී ලාකේය රූපවාහිනිය ඉතිහාසය තුළ අපට අනන්‍ය දෘශ්‍ය රූපයක් අපට අනන්‍ය වූ දෘශ්‍ය සංකල්පයක්, ආකෘතියක් පොදුවේ ''ජාතික දෘශ්‍ය පින්තූරයක්'' දෘශ්‍ය සංස්කෘතිය තුළ ගොඩනගා ගැනීමට අප සමත් වූවාද යන්න කල්පනා කර බැලිය යුතුය (වීරසිංහ, 2007). රූපවාහිනිය හෝ රූපවාහිනී දෘශ්‍ය රූපය යනු අවට බාහිර ලෝකයෙහි, සමාජයෙහි ප්‍රපංච, සිද්ධි, ක්‍රියාවලීන් මානව සම්බන්ධතා, මානව චර්යා, මානව මනෝභාව ආදිය උදාසීනව, මධ්‍යස්ථව, යාන්ත්‍රික පරාවර්තනයක ස්වරූපයෙන් වාර්තා කිරීම නොව, ඒවා ඉතිහාසයේ, සංස්කෘතියේ සහ අදාළ සමාජයේ මානව ද්‍රව්‍යයේ නියමයන්ට, ඒවායේ ගතිස්වභාවයන්ට අනුකූලව අභිසංස්කරණාත්මක නිරූපණයකි. ඇත්ත වශයෙන්ම රූපවාහිනී දෘශ්‍ය රූපය යනු යථාර්ථයේ පරාවර්තනයක් නොව එහි නිරූපණයකි.

සමකාලීන සමාජ මෙන්ම පුද්ගලික ජීවිතය තුළ රූපවාහිනිය ප්‍රබල සහ ප්‍රචලිත සංහතික සන්නිවේදන සහ සංහතික ප්‍රාසංගික මාධ්‍යයක් බවට පත්වීමට බලපා ඇති ඓතිහාසිකව වර්ධනය වූ මූලික සාධක රැසක් පෙන්වා දිය හැකිය. ඉන් පළමුවැන්න තාක්ෂණික සංශ්ලේෂියභාවය සහ දෙවැන්න වන්න නිර්මාණාත්මක, ප්‍රභේදාත්මක සංශ්ලේෂිභාවයයි. ඒ ඒ රටවලට සරිලන ආකාරයට ජාතික දෘශ්‍ය රූපත් නිර්මාණය කරගැනීමේ දී ඉහත ගෙන හැර දක්වන ලද සාධක ද්විත්වයෙන් ඉතා වැදගත් සාධකයක් වන්න් නිර්මාණාත්මක, ප්‍රභේදාත්මක, සංස්ලේශියකරණයයි. යම් ජනවර්ගයක්, ජාතියක්, සිය ඓතිහාසික සමාජ-සංස්කෘතික පරිණාම ක්‍රියාවලිය තුළ දී අදාළ සමාජයෙහි මානව ද්‍රව්‍යයට සරිලන ආකාරයට, එම මානව ද්‍රව්‍යයේ මූලික ගති ලක්ෂණ, ස්වභාවයන් චිත්තස්ථිතිය, චිත්තවෘත්තිය ආදී මානව සත්තාවේ අභ්‍යන්තර ගතික නිරූපණය කිරීමට, විදහා දැක්වීමේ ප්‍රකට කිරීමේ, නියෝජනය කිරීමේ, කාලීනව ඉදිරිපත් කිරීමේ මාදිලියක් ලෙස වර්ධනය වන්නා වූ විවිධ කලා ප්‍රභේද රූපවාහිනී දෘශ්‍ය රූපය තුළ ඒකීය සමස්තයක් ලෙස සංශ්ලේෂිකරණය වී තිබේ.(ෆොන්සේකා, 2015). මේ අනුව ජාතික රූපවාහිනී රූපය යනු අදාළ සමාජයෙහි පුරාණෝක්තික, ආගමික, දාර්ශනික, කලාත්මක, සමාශ්‍රය, සන්නිවේදන, දෘෂ්ටිවාදී, දේශපාලන ආදී සම්බන්ධතාවල සංශ්ලේෂණාත්මක වූද අභිසංස්කරණාත්මක වූද නිර්මිතයකි.

ශ්‍රී ලාංකේය දෘශ්‍ය සංස්කෘතික ඉතිහාසය තුළ නිලීන දෘශ්‍ය රූපය ප්‍රකට කර ගැනීම සහ එය සමකාලීන අවශ්‍යතාවලට සරිලන ආකාරයට අභිසංස්කරණය කරගැනීම සැබෑ ශ්‍රී ලාංකේය ජාතික රූපවාහිනියක් සඳහා අත්‍යවශ්‍ය, මගහැරිය නොහැකි කර්තව්‍යයකි. නමුත් වර්තමාන ශ්‍රී ලාංකේය රූපවාහිනී දෘශ්‍ය රූපයේ සැබෑ ස්වරූපය නිරීක්ෂණය නොවන්නේ එය සරල වෙළඳපොළ තර්කනයට යටත්ව ක්‍රියාත්මක වීමත්, සමකාලීන ගෝලීය දෘශ්‍ය සංහතික සංස්කෘතික, ගතික සහ ප්‍රවණතා මගින් ආක්‍රමණය කර තිබීමත්, ශ්‍රී ලාංකේය ජාතික රූපක, ශෛලීන්,



ආකෘති, ස්වරූප ගවේෂණය කිරීමේ ශාස්ත්‍රාලීය සහ වෘත්තීය අධ්‍යයනයන් නොවීමත් නිසාය. ඒ නිසා ජාතික දෘශ්‍ය රූපය හඳුනා ගන්නට නොහැකි තරමට ම විකෘති වී ඇති අතර, සමකාලීන රූපවාහිනිය විකාර දෘශ්‍ය රූපයක් නිර්මාණය කරමින් එය දශලක්ෂ සංඛ්‍යාත ප්‍රේක්ෂකයින් මත බලහත්කාරයෙන් ආරෝපණය කරමින් සිටී. මෙය ජාතික සංස්කෘතියේ දෘශ්‍ය රූපයේ ශක්‍යතා සහ විභවතාවල නිර්මාණාත්මක වර්ධනයට, හැඩගැස්මට ප්‍රබල බාධාවකි.

වර්තමාන ජාතික දෘශ්‍ය රූපය ගොඩනගා ගැනීමට ඇති තවත් ප්‍රබල න්‍යායික - සංකල්පීය බාධකයක් වන්නේ දනට රූපවාහිනිය පිළිබඳ ලෝක මට්ටමින් සිදු කර ඇති අධ්‍යයනයන් මූලික වශයෙන් සමාජ විද්‍යාත්මක, කලාත්මක, සෞන්දර්යාත්මක, සන්නිවේදනාත්මක සංස්කෘතිකවේදාත්මක, වෙළඳ ප්‍රචාරණාත්මක සහ දේශපාලනික ආදී විෂය ක්ෂේත්‍රවලට සීමා වී පැවතීම නිසා රූපවාහිනිය නම් වූ සංකීර්ණ සංහතික ප්‍රපංචය සාමස්තිකව දාර්ශනික පර්යාලෝකයක් තුළ ගවේෂණය කර සොයාගත් සාමස්තික ව්‍යුහාත්මක, දාර්ශනික - සංස්කෘතිකවේදාත්මක සංකල්පීය සහ ක්‍රමවේදී පද්ධතියක් නොමැතිකම දැක්විය හැකිය. විශේෂයෙන්ම රූපවාහිනිය තිරමාධ්‍ය සංස්කෘතියේ ස්වරූපයක් ලෙස එහි හරය, නියමානුකූලතා, ගතිකත්වය සහ ප්‍රවණතා අද්‍යතන සන්දර්භය තුළ නිසි ලෙස සහ අවශ්‍ය පරිදි අධ්‍යයනය කර නොමැතිකම ද පෙන්වාදිය යුතුය. දනට රූපවාහිනිය සහ එහි අන්තර්ගත අධ්‍යයනය පිළිබඳ ආධිපත්‍ය දරන සාම්ප්‍රදායික-විචාරාත්මක ප්‍රවේශය වෙනුවට දාර්ශනික-සංස්කෘතිකවේදාත්මක ප්‍රවේශය වඩාත් සක්‍රිය වන බව අපගේ අදහසයි.

මේ නිසා අවට ලෝකය විකෘති කරමින් සහ විපරිවර්තනය කරමින් සමකාලීන රූපවාහිනිය සිදු කරන්නා වූ බලපෑමේ යාන්ත්‍රණය අනාවරණය කිරීමට සමත් නිශ්චිත න්‍යායක් සමකාලීන රූපවාහිනියට අවශ්‍ය බව අපගේ වැටහීමයි.

වර්තමාන මානවයාගේ ප්‍රබලතම සවිඥානකාරක මෙවලම බවට පරිවර්තනය වී ඇත්තේ දෘශ්‍ය සංස්කෘතිය වන අතර, එහි ප්‍රධානතම මාධ්‍ය සහ යන්ත්‍රණය ලෙස ක්‍රියාකරන්නේ රූපවාහිනිය බව අවධාරණය කළ යුතුය. 21 වැනි සියවසේ ජීවත්වන මිනිසාගේ ප්‍රබලතම සවිඥානකාරක මෙවලම දෘශ්‍ය සංස්කෘතිය බවට පත් වී ඇති අතර මානවයාගේ ප්‍රථම විඥානකාරක ස්වරූපය වූයේ ද දෘශ්‍ය සංස්කෘතියයි. මේ නිසා මානවයාගේ සත්තාජනන සහ ඓතිහාසික පරිණාමයෙහි ලා දෘශ්‍ය සංස්කෘතිය සුවිශාල කාර්යභාරයක් ඉටු කර ඇති බව පෙන්වාදිය යුතුය. අද්‍යතනයේ දී ප්‍රජානනය ලෝකයේ මූලික ගති ලක්ෂණය බවට පත් වී ඇතිතේ එහි සත්තා විචාරාත්මක අදහසින් නොව, ඥානවිභාගාත්මක අදහසිනි. එනම් සමකාලීන මිනිසාට වැදගත් වන්නේ සහ මූලික වන්නේ දැන ගන්නේ මොනවාද යන්න නොව, දැන ගන්නේ කෙසේද යන්නය.

සමකාලීන රූපවාහිනියේ දෘශ්‍ය රූපය අධ්‍යයනය කිරීම කෙරෙහි වර්ධනය වන දාර්ශනික සහ සමාජ-මානව ශාස්ත්‍ර උනන්දුව අප ඉහත පෙන්වා දෙන ලද සත්භාවවිචාරාත්මක සහ ඥානවිභාගී විරෝධාභාසය මගින් තත්ත්වාරෝපණය කරන්නේය. එසේම විඥාපන සමාජයෙහි පශ්චාත්නූතනවාදී අවකාශය තුළ ලෝකය සංජානනය කරගැනීමේ සබුද්ධික-තාර්කික සංකතිකාව දුර්වලවීමේ ප්‍රවණතාවක් එක් අතකින් නිරීක්ෂණය වන අතර අනෙක් අතින් ලෝකය සංජානනය කර ගැනීමේ දෘෂ්ටික-රූපක සංජානනය වර්ධනය වීමේ ප්‍රවණතාවක් ඉස්මතු වෙමින් එය වේගයෙන් ව්‍යාප්ත වෙමින් පවතී. සමකාලීන දෘශ්‍ය සංජානනයේ දෘෂ්ටික-රූපක සංජානනයේ භූමිකාව සුවිශාල ලෙස වර්ධනය වන අතර, ලෝක සංජානනයේ දෘෂ්ටික-රූපක සංජානනය පුද්ගලික පමණක් නොව, සමාජීය ගතිලක්ෂණ ගන්නා බව වර්තමාන පර්යේෂණ මගින් තහවුරු වී තිබේ. මෙහිදී අපට ඉතා වැදගත් වන්නේ ලෝකය සංජානනය කරගැනීමේ භාෂාත්මක, තාර්කික-වියුක්තක ස්වරූපවලට සම්බන්ධව දෘෂ්ටික-රූපක සංජානනය ස්වාධීන පැවැත්මක් අත්පත් කර ගැනීමයි.



ඕනෑම මානව භාෂාවක දෘශ්‍ය තත්වය මූලාකෘතික ස්වභාවයක් දරන අතර, භාෂාවේ ක්‍රමික වර්ධනයත් සමග එහි දෘශ්‍ය ස්වරූපය ද්විගඝට්ටනාත්මක නිෂේධනාත්මක ස්වරූපයෙන් ඊට අන්තර්ගත කර ගන්නා අතර, සියලුම වචන භාෂාවේ නිශ්චිත දෘෂ්ටික-රූපක ස්වරූපයක් සමග සම්බන්ධ නොවේ. ඒ නිසා වචන පාදක කරගත් මානව භාෂාවේ සංකල්පීය, වියුක්ත, අමූර්ත, තාර්කික ආදී සංරචක භාෂාවේ වියුක්තභාව, පරිකල්පනීයභාවය දියුණු හා තියුණු කළ අතර, එමගින් ලෝකය සහ සමාජ යථාර්ථය පිළිබඳ අවබෝධය ගැඹුරු කළේය. නමුත් නූතන යුගය අවසානයේ දී සහ විශේෂයෙන් පශ්චාත් නූතන යුගයේ දී ප්‍රබල දෘශය මාධ්‍ය ලෙස රූපවාහිනිය ව්‍යාප්ත වීමත් සමග ලෝකය සහ සමාජ යථාර්ථය කෙරෙහි වූ මානව සම්බන්ධතා, අවබෝධනය ප්‍රපංචවාදී පෘෂ්ඨීය තලයකට ගමන් කළේය. මේ අනුව රූපවාහිනී මාධ්‍ය යනු යථාර්ථය ව්‍යුහියකරණයේ සුවිශේෂී මාදිලියකි. එම රූපවාහිනී මගින් අභිසංස්කරණය කරනු ලබන යථාර්ථය මගින් ඊට සරිලන රූපවාහිනී චින්තනයක්, රූපවාහිනී දෘෂ්ටිවාදයක් හැඩගස්වනු ලබන්නේය. එම රූපවාහිනී දෘෂ්ටිවාදය සමකාලීන සංහතික සංස්කෘතියේ අවියෝජනීය සංරචකයක් ලෙස ඉදිරිපත් වන අතර එය විවිධ ජනවාර්ගික, සංස්කෘතික, විෂමතා අවම කිරීමට ඉවහල් වන බව පෙනේ (Matt, 2010). එය සමාජ, සංස්කෘතික, වාර්ගික, ජනවාර්ගික, බුද්ධිමය, සෞන්දර්යාත්මක සහ දේශපාලනික, දෘෂ්ටිවාදී වෙනස්කම් අල්පීකරණයට ලක් කොට සමජාතිකරණයකට ලක් කිරීමේ හැකියාවක් පවතී. සාම්ප්‍රදායික මාධ්‍ය පඨිතවලින් රූපවාහිනී මාධ්‍ය පඨිත මූලික වශයෙන් වෙනස් වන්නේ එය සමගාමී පඨිතයක් වන බැවිනි. එය පඨිතයේ නූතනවාදී ස්වරූපය අතික්‍රමණය කරන්නේය. රූපවාහිනි පඨිතයේ නූතනවාදී ස්වරූපය බටහිර කේන්ද්‍රිය ආධිපත්‍යවාදී ස්වභාවයක් පෙන්නුම් කරන අතර, එය විවිධ වූ වාර්ගික, ජාතික, සංස්කෘතික, දේශපාලනික අනන්‍යතා විනාශ කර දමන්නේය. නිදර්ශනයක් වශයෙන් පසුගිය සියවස් හතරක පමණ කාලයක සිට ක්‍රියාත්මක වූ නූතනවාදය සමග සෘජු ලෙසම

සම්බන්ධ වූ විසිවැනි සියවසේ ආරම්භයේ දී සිටම ලෝක රූපවාහිනියේ සංස්කෘතික, සමාජ, දේශපාලනික සහ විඥාපනික පදනමේ සංකල්පීය සහ ප්‍රතිපත්තිමය ප්‍රවණතාව ගොඩනැගීමට දායක වූ ලිබරල්වාදය, කොමියුනිස්ට්වාදය සහ ජාතිකවාදය යන දෘෂ්ටිවාද ත්‍රිත්වයම වර්තමානය වන විට ගැඹුරු අර්බුදයකට ගොස් ඇති අතර, එය අද්‍යතන රූපවාහිනියේ බිඳ වැටීමට ද බලපා ඇති බව අපගේ අවධාරණයයි.

ජාතික ස්වරූපයේ රූපවාහිනියක සංකල්පීය සහ ප්‍රතිපත්තිමය ශක්‍යතා ප්‍රකට කරගැනීම සඳහාත්, ඒ ඒ මානව ද්‍රව්‍ය සහ සංස්කෘතිය සමග සබැඳ හර පද්ධති සහ වටිනාකම් ශක්තිමත් කිරීම සඳහාත්, ඒවා බහුවිධත්වයකින් යුතුව ඒකීය සමස්තයක් ලෙස ප්‍රවර්ධනය කිරීම සඳහාත්, රූපවාහිනිය පිළිබඳ දර්ශනයක් අත්‍යවශ්‍ය බව අපගේ අවබෝධයයි. ශ්‍රී ලාංකේය රූපවාහිනිය ආරම්භයේ සිටම වර්ධනය වූයේ ශ්‍රී ලාංකේය මානව සත්තාවේ නැති වී ගිය හෝ විකෘති වී ගිය හෝ බටහිර සංස්කෘතික ආක්‍රමණ නිසා අවරෝධනය වූ පෙරදිග මානව සත්තාවේ ගුණ සහ හර පද්ධති යළි ඉස්මතු කර ගැනීම සඳහා හෝ එය නවීකරණය කිරීම සඳහා හෝ එය ප්‍රවර්ධනය කිරීම සඳහා හෝ යොදාගත් සංස්කෘතික මෙවලමක් ලෙස නොව, අප ඉහත ගෙනහැර දක්වූ නූතනවාදයේ එක් විනාශකාරී සහ ආක්‍රමණශීලී දෘෂ්ටිවාදයක් වූ නව ලිබරල්වාදයට අනුව ශ්‍රී ලාංකේය මානව ද්‍රව්‍ය, මානව සම්බන්ධතා නවීකරණය හෝ වෙනස්කිරීම සඳහාය. වර්තමානය වන විට එය රූපවාහිනී තිර සංස්කෘතියේ පමණක් නොව, සමස්ත මානව සංස්කෘතියේම සහ මානව සත්තාවේම ගැඹුරු අර්බුදයක් පමණක් නොව, බිඳවැටීමක් ඇති කර තිබේ. රූපවාහිනීය ශ්‍රී ලාංකේය සමාජ මන්දිරය සාධනීය ලෙස ගොඩනැගීමේ, නිර්මාණය කිරීමේ ධනාත්මක ද්‍රව්‍යයක් ලෙසත්, නැතිවී ගිය වටිනාකම් ප්‍රතිඋත්පාදනය කිරීමේ පරම්පරා අතර සම්බන්ධතා සමෝධානය කිරීමේ යුක්තියේ, අයිතියේ සහ නිදහසේ නිවැරදි අවබෝධය ජනනය කිරීමේ, එසේම සෞන්දර්යාත්මක සහ කලාත්මක රසභාව සේම කායික සහ මානසික නිරෝගිභාවය



වර්ධනය සහ ශක්තිමත් කිරීමේ උපකරණයක් ලෙසත් යොදා ගැනීමට හැකිවන පරිදි රූපවාහිනියේ සංකල්පීය සහ ප්‍රතිපත්තිමය ප්‍රවණතාව හැඩගැස්විය යුතුය.

රූපවාහිනිය තිර සංස්කෘතියේ ස්වරූපයක් ලෙස එහි ක්‍රියාකාරිත්ව කාර්ය භූමිකාව බහුකෘත්‍යාත්මක ස්වභාවයක් ගන්නා අතර, රූපවාහිනියේ කාර්යයන් එහි වැඩසටහන්වල ගතිලක්ෂණ පොදු සමාජ-සංස්කෘතික අන්තර්ගතය හා වැඩසටහනේ ව්‍යුහය ආදිය මත රඳාපවතින්නේය. මෙහිදී අපට ඉතාම වැදගත් වන්නේ දාර්ශනික-සංස්කෘතිකවේදාත්මක ප්‍රජානනයේ පැතිකඩ තුළ රූපවාහිනී දර්ශනයේ සමාජීය කාර්යයන්ය. මෙම කාර්යයන් ශ්‍රී ලාංකේය සංස්කෘතියට අදාළව නිර්වචනය සහ නිර්ණය කර ගැනීම ශ්‍රී ලාංකේය රූපවාහිනියක් සඳහා වූ ප්‍රයත්නයේදී මගහැරිය නොහැකි කර්තව්‍යයකි. ඒ සඳහා ජාතික සහ ලෝක සනිදර්ශනය නිර්මාණය කිරීම, එය අර්ථකථනය කිරීම, මෙන්ම ලෝක ක්‍රියාවලින් අගැයීම, තක්සේරුකිරීම ආදිය ජනතාව, ප්‍රේක්ෂකයින් සඳහා ඉතා වැදගත් වන අතර, එය අවසාන වශයෙන් සමාජීය ලෝකදෘෂ්ටිවාදය සංවිධානය කිරීම සමග සමපාත වන්නේය. එම කර්තව්‍ය ඉටු කිරීම සඳහා රූපවාහිනියේ සමස්ත ප්‍රභේද (ශානර) පද්ධතිය ශ්‍රී ලාංකේය පදනමක් සහ අරමුණු අනුව ගොඩනැගිය යුතු වන්නේය.

20 වැනි සියවස අග භාගයේ සහ 21 වැනි සියවස මුල ගෝලීය නවලිබරල්වාදී ප්‍රවණතා උත්සන්න වීම සහ ගෝලීය නවලිබරල්වාදය ආක්‍රමණශීලී සහ සංග්‍රාමික ස්වරූපයෙන් ජනවාර්ගික, ජාතික, සංස්කෘතික අනන්‍යතා සහ ස්වෛරීභාවය විනාශ කරමින් මානව සංහතියේ සමාජ පරිණාමය නව අවධියකට ප්‍රවිෂ්ට වීමත් සමග යළිත් ජනවාර්ගික සහ ජාතික අනන්‍යතා පිළිබඳ ප්‍රශ්නය සංකීර්ණ විය. එසේම දැනටමත් තාක්ෂණිකවේදයේ පස්වන සහ හයවන මාදිලි වර්ධනය වීමත් සමග ලොව පුරා විසිරී ජීවත් වන පුද්ගලයින් සහ විවිධ විෂම ජනවාර්ගික සහ ජාතික ප්‍රජාවන් අතර ගෝලීය සංඛ්‍යාංක

අන්තර්ක්‍රියාකාරකම් ව්‍යාප්ත කිරීමේ සහ ශක්තිමත් කිරීමේ විවිධ ස්වරූප, විධික්‍රම සහ භාවිතයන් ඉතා වේගයෙන් වර්ධනය වෙමින් පවතී. වර්තමානයේ දී පවා ගෝලීය සංඛ්‍යාංක වේදිකා මාර්ග භාවිතය දෛනික කාර්යයක් බවට පත් වී ඇති බව සැලකිල්ලට ගත යුතු විශේෂ තත්ත්වයකි. ගෝලීය උපරි සමාජ බලවේග එම වේදිකා-මාර්ග ඔස්සේ විඥාපනික සහ ප්‍රජානන තාක්ෂණයන් භාවිත කරමින් ලොව පුරා ජීවත් වන පුද්ගලයන්ගේ සහ ලොකු කුඩා ප්‍රජාවන්ගේ චර්යාවන්ගේ සහ හැසිරීමේ අභිප්‍රායන්, අරමුණු, පුරුෂාර්ථ සහ හර පද්ධති වෙනස් කරමින් සිටින්නේ ස්වෛරී රාජ්‍යයන්ගේ පාලනයෙන් පරිබාහිරවය.

මෙම සාධක දෙක විවිධාකාරයෙන් උපයෝගි කරගනිමින් ගෝලීය උපරිම සමාජ බලවේග ස්වෛරී ජාතික රාජ්‍යයන් තුළ විවිධාකාරයෙන් සහ විවිධ මට්ටමේ සමාජ, දේශපාලන, ආර්ථික, සංස්කෘතික සහ දෘෂ්ටිවාදී අස්ථාවරභාවයන් සහ අවුල් ඇති කිරීමට නිරන්තරවම ප්‍රයත්න දරන්නේය. ඒ සඳහා සංහතික මාධ්‍ය ඇතුළු රූපවාහිනී ක්ෂේත්‍රයද උපකරණය ලෙස යොදා ගන්නා බව පෙන්වාදිය යුතුය.

මේ නිසා මෙකී ගෝලීයකෘත අවකාශය තුළ ජාතික ස්වරූපයේ රූපවාහිනියක සංකල්පීය සහ ප්‍රතිපත්තිමය ශක්‍යතාව පිළිබඳ දාර්ශනික පර්යාලෝක සකස්කර ගැනීමේ දී වඩාත් ම යෝග්‍ය හා වැදගත් වන්නේ ශ්‍රී ලංකාව බහුජාතික සමාජයක් ලෙස සැලකීම නොව බහුවාර්ගික සමාජයක් ලෙස සැලකීමය. ඒ නිසා විවිධ ජනවාර්ගික, සංස්කෘතික සාම්ප්‍රදායික අනන්‍යතා, විශේෂතා ඒකීය සමස්තයක් ලෙස ශක්තිමත් කරන ව්‍යුහයක් වන්නේ ජනතා ව්‍යුහය මිස ජාතික ව්‍යුහය නොවේ. ජාතික ව්‍යුහය මගින් සියලු ජනවාර්ගික, සංස්කෘතික, සාම්ප්‍රදායික ආධ්‍යාත්මික වටිනාකම් සහ විශේෂතා විනාශකර දමන්නේය.

මේ අනුව ශ්‍රී ලාංකේය රූපවාහිනියේ ''ජාතික'' රූපය නිර්මාණය කර ගත යුත්තේ දේශපාලන සහ නෛතික වශයෙන් ''ජාතික'' ස්වරූපය නිෂේධනයව එහි ජනතා ස්වභාවය



ශක්තිමත් වන පරිදිය. මෙම ''ජාතික'' රූපයේ මූලික හරය සහ අන්තර්ගතය විය යුත්තේ බහුවාර්ගික, බහු සංස්කෘතික අන්තර්ක්‍රියාකාරිත්වය, අනුකලනාත්මක සහ සමෝධානාත්මක පදනම මත ගොඩනැගෙන ඒකීය ශ්‍රී ලාංකේය ජනතාවගේ ප්‍රකාශනයක් වශයෙනි. ඒ සඳහා විවිධ ජනවර්ග සිය සමාජ-සංස්කෘතික පරාවර්තන ඉතිහාසය තුළ නිර්මාණය කර ගන්නා ලද ජනවාර්ගික, සංස්කෘතික, සංඥා, සංකේත, රූපක ආදිය අන්තර්සංඥාර්ථවේදී සහ පාරසංඥාර්ථවේදී පරිගතයක් තුළ ගවේෂණය කිරීමේ ක්‍රමවේදයක් නිර්මාණය කරගත යුතු බව අපගේ අදහසයි(Rose, 2007).

මෙහිදී ඉතා වැදගත් වන්නේ රූපවාහිනී සන්දේශ, පඨිත නිර්මාණය වන්නේ විවිධාකාර වූ සන්නිවේදනාත්මක සහ කලාත්මක මාධ්‍යයන්ගෙන් වන අතර, ඒවා ස්වභාවයෙන්ම සංශ්ලේෂිය වූ සංකීර්ණ සංඥාවලින් සමන්විත වන බවය. රූපවාහිනී භාෂාවේ විශේෂත්වය වන්නේ එය යථාර්ථයේ යාන්ත්‍රික පරාවර්තනයකට වඩා යථාර්ථයේම සංඥා සහ සංකේත පාවිච්චි කරමින් ඒවා නිශ්චිත පරිගතයක් තුළ සවිඥානිකව සහ නිර්මාණාත්මකව අභිසංස්කරණවාදී මූලධර්මවලට අනුකූලව භාවිත කිරීමයි. යම් ජනතාවකගේ සත්තාව පාදකව ගොඩනැගෙන සංඥා, සංකේත පද්ධතිය මත සංස්කෘතිය ගොඩනැගෙන අතර ඒ සියල්ල ඒකීය සමස්තයක් ලෙස ගත් විට අදාළ ජනතාව ගොඩනැගී ඇති මානව ද්‍රව්‍ය සකස් වේ(වීරසිංහ, 2016). එම මානව ද්‍රව්‍යයේ මූලික ගතිලක්ෂණ, ගුණ සහ හැඩතල නිරූපණය කරන ශ්‍රී ලාංකේය රූපයක් අප සවිඥානිකව අදාළ සමාජ නියමයන්ට අනුකූලව නිර්මාණය කර ගැනීම සඳහා සාම්ප්‍රදායික, පූර්ව නූතන සංඥා සහ සංකේත පද්ධති අධ්‍යයනය කිරීම මෙ ගෝලීය යුගයේ තීරණාත්මක වැදගත්කමක් උසුලන්නේය.

## ආශ්‍රේය ග්‍රන්ථ


1. වීරසිංහ, වියුඩර් (2017), ළමා මානසිකත්වය විපරිවර්තනය කිරීමෙහිලා සමකාලීන රූපවාහිනිය සමාජ මානසිකත්ව සංස්කෘතියෙහි විප්ලවීය උපකරණයක් ලෙස, විමලධම්ම ප්‍රදීපිකා, ශාස්ත්‍රීය සම්භාෂණ, සංස්: හේරත්හල්මිල්ලෑවේ උපාලි හිමි, සුනිල් ගොඩගේ, මුද්‍රණය, එස්. ඇන්ඩ් ප්‍රින්ටර්ස්, කොළඹ.
2. වීරසිංහ, වියුඩර් (2016), සිවිමාන - ජාතික සහ ගෝලීය ප්‍රවණතා පිළිබඳ විචාරාත්මක පර්යාලෝක, තෝතැන්න පබ්ලිෂින් හවුස්, ආණමඩුව.
3. වීරසිංහ, වියුඩර් (2009), විද්‍යාත්මක රූපවාහිනීවේදයක් කරා, රූපවාහිනී සමීක්ෂා - දෙවන කලාපය, සංස්: ගාමිණී වේරගම, නන්දසේන පලිහක්කාර හා ජී.ඒ. ජනප්‍රිය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
4. Clerke R, Knoke R. (2010), Ciyber War. The next Threat to National Security and what to do about it. Ney: Harper Collins.
5. Toffler A The Third Wave (1980), Bontorn Book, USA.
6. ෆොන්සේකා, ප්‍රියන්ත (2015), The X Files - ශානරය, මුහුම්කරණය හා පශ්චාත් නූතනවාදය, රූපවාහිනී සමීක්ෂා, නවවැනි කලාපය, සංස්: සුගත් වටගෙදර, නන්දසේන පලිහක්කාර, ජී.ඒ. ජනප්‍රිය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, බත්තරමුල්ල.
7. Matt Briggs (2010). Television, Audiences and Every day Life, Tata McGraw Hill Education PL. Newdelhi.
8. Rose Gillian (2007), Visual Methodologies an Introduction to the Interpretation of visual materials, Second Edition, Sage Publications, London.